

# මිල්ටන්ගේ බාල පුතා ලංකාවට ගියේ තාත්තාගේ සිංදු වෙනස් කරන්න ද?

**තිළිණ කෞශල්‍යා විජේසිංහ**

**හදිසියේ ලංකාවට යන්න හිතුවේ?**
අපි තාත්තා වෙනුවෙන් ෂෝ එකක් කරන්න හිතාගෙන හිටියා. ඒත් අපිට ඒක සැලසුම් කරන්න වෙලාව මදි වුණා. ඉතින් සිංදුවක් කරන්නත් හිතාගෙන තමයි ලංකාවට ගියේ. ඒ දේ නම් කළා.

**මෙදා සැරේ තාරකගේම ගීතයක් රසිකයින් අතරට ගෙනාවා නේද?**
ඔව්, 'හිත පිරුණු ආදරේ කියලා මගේම ගීතයක් කළා. ඒ ගීතය කළේ කාවින්ද්‍යා අධිකාරිත් එක්ක. ගීතයට වීඩියෝවකුත් කරලා රසිකයින් අතරට දීලා අපි එන්නේ.'

**කාවින්ද්‍යා අධිකාරිත් එක්කම යුග ගීතයක් ගායනා කරන්න විශේෂ හේතුවක් තියෙනවා ද?**
මගේ අයියා රනිල් ගිය අවුරුද්දේ කරපු ෂෝ එකේදී කාවින්ද්‍යාත් සිංදුවක් කිව්වා. ඉතින් එයත් එක්ක සිංදුවක් කරන්න ඕනේ කියලා හිතුණා. කාවින්ද්‍යාත් ඒකට කැමති වුණා. අලුත් පරම්පරාව එක්ක දෙයක් කරන්න ඕන නිසා තමයි මේ ගීතය ඇයත් එක්ක ගායනා කළේ.

**තාරක තාත්තාගේ ගීතත් රිමේක් කළා නේද?**
ඔව්. 2014 දී තාත්තාගේ 'කාගෙදෝ ආරාධනා' කියන ගීතය රිමේක් කළා. මේ සැරේ 'මේ මැයි ගහයට' ගීතය රිමේක් කළා. මියුසික් ටිකක් වෙනස් කරලා තියෙන්නේ. ලොකු වෙනස් කිරීමක් කරලා නැහැ.

**රනිල් නම් ලංකාවට ගිහින් මිල්ටන් මල්ලවාරච්චි උපහාර ප්‍රසංගය කරලා යනවා. ඒ ප්‍රසංගයේ තාරක සිංදු කියන්නේ නැත්තේ ඇයි?**
ඒකට අවස්ථාවක් ලැබුණේ නැහැ. බාහිර වැඩ කටයුතු නිසා ඒක මඟ හැරුණා.

**තාරක මිල්ටන් මල්ලවාරච්චිගේ පුතා විදියට මාධ්‍ය ඉදිරියේ ගනුදෙනු නොකරන්නත් හේතුවක් ඇති?**
යම් යම් හේතු කාරණා නිසා තාත්තාගේ ගීත මගේ හඬින් ගායනා කරන්න බැරි වුණා. වැඩිපුරම මම මාධ්‍ය ඉදිරියට ආවෙත් නැහැ. හැබැයි මට තාත්තා වගේම සිංදු කියන්න පුලුවන්. මම අවුරුදු දෙක තුනකට සැරයක් ගිහින් ගීතයක් කරලා ලංකාවේ රසිකයින්ට දීලා එනවා.

**ඕස්ට්‍රේලියාවේ දී වෘත්තීමය විදියටද ගායන කටයුතු වලට සම්බන්ධ වෙන්නේ ?**
ඔව්. මට ප්‍රසංග වලට, පැදුරු පාටිවලට සම්බන්ධ වෙන්න ආරාධානා ලැබෙනවා.

**රනිල් එක්කද ප්‍රසංග වලට සහභාගී වෙන්නේ?**
ලැබෙන ආරාධනා වලට එයා නැතුව මම තනිවම සම්බන්ධ වෙන්නේ. ලැබෙන ආරාධනා වලට මම විවිධ රටවලට යනවා ගීත ගායනා කරන්න.

**අයියයි මල්ලියි එකතු වෙලා ගීතයක් කරන්න අදහසක් නැද්ද?**
තාම නම් එහෙම අදහසක් නැහැ. හැබැයි අයියගෙන් පොඩි යෝජනාවක් ඇවිත් තියෙනවා. තාත්තා වෙනුවෙන් දෙන්නම එකතු වෙලා ලබන අවුරුද්දේ ප්‍රසංගයක් කරමු කියලා. ලබන අවුරුද්දට තාත්තා මිය ගිහින් අවුරුදු විස්සකුත් වෙනවා නේ.

**දැන් පවුලේ හැමෝම ඕස්ට්‍රේලියාවටම වුණා නේද?**
අයියයි, අක්කලා දෙන්නයි, අම්මයි, අපි හැමෝම ඕස්ට්‍රේලියාවේ මෙල්බන් වල තමයි පදිංචි වෙලා ඉන්නේ.

**ස්ථිරවම ලංකාවේ පදිංචි වෙලා ගායන ක්ෂේත්‍රයේ ගමනක් යන්න අදහසක් නැද්ද?**
බලාපොරොත්තුවක් තියෙනවා. දැන් මගේ දුවට අවුරුදු දෙකයි. එයාගේ අධ්‍යාපන කටයුතු ඉවර කරගෙන ලංකාවට යන්න අදහසක් තියෙනවා.

**දුව සංගීතයට ලැදිද?**
මම ගීත ගායනා කරද්දී වගේම තාත්තාගේ ගීතත් ඇහෙන කොට දුව පුළුවන් විදියට ඒ සිංදු කියනවා.

**කරපු ගීත වලට ප්‍රතිචාර ලැබෙන්නත් කලින්ම ලංකාවෙන් එනවා නේද?**
මේ ආටිකල් එක පත්තරේ පළවෙද්දී අපි ලංකාවෙන් ඇවිත් තියෙයි. අපි අවුරුදු දෙකකට පස්සේ ලංකාවට යන්නෙ. ඉතින් ආපු වැඩ ටික කරලා මෙහේ වැඩවලටත් ඉන්න ඕනෑ නිසා ආයෙම එනවා.



## THARAKA launches maiden song

Tharaka Mallawarachchi who had so fat sung songs of his father Milton Mallawarachchi , recently launched his maiden original song which was penned by SLBC Chairman Nanda Muruththettuwegama. Here Rukshan Karunanayake who composed music for the song is seen presenting the CD to Mr. Nanda Muruththettuwegama together with veteran journalist Ananda Padmasiri who coordinated the recording.

